# කවිරස විඳිත්වා.



## එම්බා අමුඩය!

ල ක්  බිම පුරා නිල්වන් කෙත් පෙල සැදූ   යේ
එ ක්  වුණු දනන් ගෙන් මහ දෙමළුන් නැසූ   යේ
වි ක්  මැති අප රජුන් ලොව ඉහළින් දිළු   යේ
ම ක්  කොම මෙදු සිංහල අමුඩෙනි කෙරු   යේ



මිණි මුතු රැසින් සැපතින් දෙරණත පිරූ   වේ
එඩිතර වීර ජාතියකට හිමි කෙරු   වේ
අනුනට දෝත පෑ නිගමන බිඳ හෙළු   වේ
අමුඩය! නිසයි මගෙ රට ජීවය ලැබු   වේ



කුඹුරෙන් ගොඩට වන් ගොවියා මඩ සෝ   දා
සිහසුන වැජඹෙන්ට සුදුසුයි කී පෙර   දා
සුනිමල් වදනෙහිද අමුඩයෙ බලය ස   දා
පිළිබිඹු වෙයි නගමු! එය ගැතිකම හැර   දා

**පී. බී. ලෝරන්ස්**

බඹරකොටුව පාසැල
වේවැල්වත්ත



## සිංහල ශෝකෝග්‍ර

සි ය ය ක්  අදික තෙතිසක් අවුරුදු පම   ණි
වි සූ ම ක්  අපට හිමිවිය යටහත් වෙමි   න
කරු ම ක්  කාර පලදීමක් තිබු බැවි   න
මෙතු වක්  කලක් අඳුරේ විය ලක් දෙර   න



කි තු ව ස්  එක් දහස් නවසිය පසුවෙමි   න
හ ත ලි ස්  අටේ මස පෙබරය ලැබ කෙමෙ   න
විදි ලෙ ස්  එසිව්වැනි දින සුබ මොහොත යෙ   න
නි ද හ ස්  මිණෙස් යලි දිලි ලකගන මුදු   න

ඇ ඳු ම ට  පැළඳුමට හා කෑමට වෙනි   න
හැම ක ට  යුතු වලට පිටරට වෙයි සර   ණි
සි හ ලු ට  මෙහෙම දිවි ගෙවුමත් නොම වටි   න
ලැ බු ම ට  නියම නිදහස දිරි වඩනු මැ   න



මි හි පි ට  වැවෙන එක දිය බිඳකුත් පම   ණි
ස හ තු ට  විලස ගතහැකි සැම පල ගොගෙ   න
කි සි වි ට  නොම හරිනු කිව් පැරකුම් වද   න
සිහිකොට  නිතින් ලක දියුණුව සදනු මැ   න

ලේනම-අකුරැස්ස  **ඩයස් ලොකු මුදලි**

---

*Spade and hoe will beat the foe!*

( දෑ ලීලෙන් බඩ ගිනි සතුරා අළවා හරින්න.!

# ලක්මවගේ ඔමදන් මුතුමැල

ල ක් මව දුකින් සෝකෙන් තැවි තැවී ය
ස ක් වල දශන විහිදෙන ඇඹුමක් වී ය
දැ ක් මට සුළු වුනත් ලක මුළු ලොව ජී ය
ල ක් මිණි පහන දැන් ගන අඳුරක් වී ය



කාලේ ගෙවී යනවා ඇසට දැක දැ කා
කාලේ අගය නො දනිති මෝඩ වූ එ කා
කාලේ අපතෙ ඇරියොත් මතු වේය දු කා
කාලේ වැඩ කරවි මතු දියුණුව ම න කා



ලොවට කෙනෙක් උපනොත් මනු කය ලැබ ම
ර ම ට වැඩ කෙරුම මයි ඔහට නිය ම
අ ප ට වැඩ කරයි නෙක රට දන බොහො ම
ගොවිට තමයි වැඩි ආයුෂ වැළඳී ම



**ඩබ්ලිව්. ආර්නෝලිස් අප්පුහාමි**

# ගොවි පෙරමුණකට එන්න!



පැනත් පැන්සලත් ගෙන සුරතට සතොස
අහරක් නැතිව රැකියක් පතනට නොබැස
නොසිතා නොකිය පුහු බස් යොමුකොට දෑඇස
තරුණිය එන්න! ගොවි පෙරමුනකට විගස!!



උ ග තෙ ක් යයි සිතා ඔබ ගොවිතැන් නොකර
සි ටි යො ත් වන්නෙ විපතකි! සිතමින් නිතර
ඔ බ ගෙ න් සැමගෙ දියුණුව පතමින් සුසර
බැ ස ග ත් තොත් අගෙයි! "ගොවියෙකුමෙන්" කුඹුර!!



කුඩා කල සිටම ඇතිකල මව් පියොද
ඔබගෙන් රටේ දියුණුව පතනව නොවෙද?
නොසිතා ඔබට ලැබෙනා බත්විත ගැනද
පොඩ්ඩක් සිතනු මැන! පසෙකට වනු යුතුද?



සැඳ සුදු වතක් දෙස් පාලනයට යන්න
කව්දයි ඔබට කීවේ මට පහ දන්න
දෙස් පාලනය පිළිබඳ වැඩ ගෙන යන්න
පළමුව හොඳයි! "ගොවිපෙරමුණ" යට එන්න!!

**ඇඹරළුවේ ආශීවංශ දයානන්ද**
"සේවා" ගොවි ජනපදය    පොළොන්නරුව




**දරුවන් උදෙසා අහාර වගා කරන්න !**